Anula Vidyalaya- Nugegoda Anula Vidyalaya- Nugegoda Anula Vidyalaya- Nugegoda

# අනුලා විද්‍යාලය - නුගේගොඩ

## දෙවන වාර පරීක්ෂණය (06 ශ්‍රේණිය) 2019

**ගණිතය**

පැය 02

විභාග අංකය/ නම: ..........................................................................................................

### I පත්‍රය

ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

01) වරකට බොන බෙහෙත් වතුර ප්‍රමාණය ප්‍රකාශ කිරීමට වඩාත් සුදුසු ඒකකය ලියන්න.

02) $<, >, =$ යන සංකේත අතරින් 5.8 ............... 5.80 යන ප්‍රකාශයේ හිස්තැනට යෙදීමට වඩාත් සුදුසු සංකේතය යෙදමින් හිස්තැන පුරවන්න.

03) මාලා සිතූ සංඛ්‍යාව ඉරට්ට සංඛ්‍යාවකි. සාමා සිතූ සංඛ්‍යාව ඔත්තේ සංඛ්‍යාවකි. දෙදෙනා සිතූ සංඛ්‍යා වල ගුණිතය ස්ථිර වශයෙන්ම පහත සංඛ්‍යා වර්ග අතරින් කුමන වර්ගයට අයත් විය යුතු ද?

$(i)$ ඔත්තේ සංඛ්‍යා $(ii)$ ප්‍රථමක සංඛ්‍යා $(iii)$ ඉරට්ට සංඛ්‍යා $(iv)$ ත්‍රිකෝණ සංඛ්‍යා

04) සණකාභයක දාර ගණන කීය ද?

05) ලවය සහ හරය එකම සංඛ්‍යාවකින් බෙදීමෙන් $\frac{12}{18}$ යන භාගයට තුල්‍ය භාගයක් ලියන්න.

06) සංවෘත සරලරේඛීය තල රූපයක් අඳින්න.

07) 4.5$m$ යන්න සෙන්ටිමීටර වලින් දක්වන්න.

08) $\frac{3}{5}$ , $\frac{3}{8}$ , $\frac{3}{4}$ යන භාග ආරෝහන පිළිවෙලට ලියන්න.

09) 53.53 කියවන ආකාරය වචනයෙන් ලියන්න.

10) 36 සමචතුරස්‍ර සංඛ්‍යාවකි. එය කී වන සමචතුරස්‍ර සංඛ්‍යාව ද?

To download past papers visit
www.vajirapani.blogspot.com

11) $\frac{7}{9} - \frac{1}{9}$ සුළු කරන්න.

12) $\frac{53}{100}$ යන්න දශම ලෙස ලියන්න.

13) $5l - 3l\ 500ml$ හි පිළිතුර ලබාගන්න.

14) සමාන්තරාස්‍රයක් අඳින්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

15) එකක් රුපියල් 13 බැගින් පේර ගෙඩි 15ක මිලදී ගැනීමට වැයවන මුදල කොපමණ ද?

16) පහත සංඛ්‍යා අතරින් 5 සහ 2 යන සංඛ්‍යා දෙකෙහිම ගුණාකාරයක් වන සංඛ්‍යා දෙක තෝරා යටින් ඉරි අඳින්න.

20, 22, 35, 30

17) 17 යනු කී වන ඔත්තේ සංඛ්‍යාව ද?

18) ඔත්තේ සංඛ්‍යාවකට වෙනත් සංඛ්‍යාවක් එකතුකළ විට පිළිතුර ලෙස ඉරට්ට සංඛ්‍යාවක් ලැබුණි. එකතු කරනු ලැබුවේ කුමන වර්ගයේ සංඛ්‍යාවක් ද?

19) $7.3 + 2.52$ හි අගය සොයන්න.

20) $3l\ 52ml$ යන්න මිලි ලීටර් වලින් ලියන්න.

## II පත්‍රය

පලමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පලමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න හතරකටත් වෙනත් කොල වල පිළිතුරු සපයන්න.

01) (a) පහත සඳහන් වාහන ඇසුරෙන් පිළිතුරු සපයන්න.

රෝද හතරේ කරත්තය



කාරය



පා පැදිය



To download past papers visit
www.vajirapani.blogspot.com

මෝටර් සයිකලය



රෝද දෙකේ කරත්තය



වෑන් රථය



(i) ඒවා "රෝද හතරක් ඇති වාහන" සහ "රෝද දෙකක් ඇති වාහන" ලෙස කාණ්ඩ දෙකකට වෙන්කර රවුම් දෙකක් තුල ලියා එම රවුම් නාම් කරන්න.

(ii) ඒවා වෙනත් ආකාරයකට කාණ්ඩ දෙකකට වෙන්කර රවුම් දෙකක් තුල ලියා එම රවුම් නාම් කරන්න.

(b) "සෘජුකෝණාස්‍රය" චතුරස්‍ර වල එක් අවස්ථාවකි. එක් චතුරස්‍ර වර්ගයකි.

(i) ඒ හැර චතුරස්‍ර වල වෙනත් අවස්ථා දෙකක් ලියන්න. (වෙනත් චතුරස්‍ර වර්ග දෙකක් ලියන්න.)

(ii) පෙළ පොතෙහි සඳහන් ලක්ෂණ අතරින් සෘජු කෝණාස්‍රය සතු ලක්ෂණ දෙකක් ලියන්න.

(c) ඝන වස්තු පාඩමේ දී ඔබ සෑදූ ඝන වස්තු ඇසුරෙන් පිළිතුරු සපයන්න.

(i) සවිධි චතුස්තලයක මුහුණත් ගණන, දාර ගණන සහ ශීර්ෂ ගණන වෙන වෙනම ලියන්න.

(ii) ඝනකයක් සෑදැමට සුදුසු පතොරමක් අඳින්න.

02) අම්මා ඇපල් ගෙඩියක් ගෙනවිත් ඉන් $\frac{1}{2}$ ක් සාමාට ද, $\frac{3}{8}$ ක් චතුරට ද දුන්නාය.

(*i*) ඉහත සඳහන් භාග දෙක අතරින් ඒකක භාගය සඳහා ලවය 6 වන සේ තුල්‍ය භාගයක් ලියන්න.

(*ii*) එකිනෙකට සමාන සමචතුරස්‍ර දෙකක් ඇඳ එක් සමචතුරස්‍රයකින් $\frac{1}{2}$ ක් ද, අනෙක් සමචතුරස්‍රයෙන් $\frac{3}{8}$ ක් ද පාට කරන්න.

(*iii*) ඉහත පාට කළ රූප අනුව $\frac{1}{2}$ සහ $\frac{3}{8}$ යන භාග අතරින් වඩා විශාල භාගය කුමක් ද?

(*iv*) අම්මා දෙදෙනාටම දුන් මුළු ඇපල් ප්‍රමාණය අම්මා ගෙන ආ ඇපල් ගෙඩියෙන් කවර භාගයක් ද?

To download past papers visit
www.vajirapani.blogspot.com

03) ළමයින් 24 දෙනෙක් සරඹ සංදර්ශනයකට සූදානම්ව සිටිති.

(*i*) ඔවුන් එක් පෙළක 6 දෙනා බැගින් වන සේ පේළි සෑදී සිටී නම්, සෑදී ඇති පේළි ගණන කීයද?

(*ii*) 24 යන සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යා දෙකක ගුණිතයක් ලෙස ලිවිය හැකි සෑම ආකාරයකින්ම ලියන්න.

(*iii*) ඒ අනුව 24 හි එකිනෙකට වෙනස් සාධක 6ක් ලියන්න.

(*iv*) ප්‍රථමක සංඛ්‍යාවක් හඳුනාගන්නේ කෙසේ ද?

(*v*) 15 සිට 30 දක්වා ඇති පූර්ණ සංඛ්‍යා අතරින් 5 හි ගුණාකාර සියල්ල තෝරා ලියන්න.

04) (*i*) 7,3,8,1 යන ඉලක්කම් හතරම එකක් එක් වරක් බැගින් ගෙන ලිවිය හැකි විශාලතම ඉරට්ට සංඛ්‍යාව ලියන්න.

(*ii*) 5 වන සමචතුරස්‍ර සංඛ්‍යාව තිත් හෝ කතිර භාවිතයෙන් අඳින්න.

(*iii*) තිත් මගින් අඳින ලද ත්‍රිකෝණ සංඛ්‍යාවක අවසාන පේළියේ තිබූ තිත් ගණන 5කි. එය කී වන ත්‍රිකෝණ සංඛ්‍යාව ද?

(*iv*) එම ත්‍රිකෝණ සංඛ්‍යාව සොයන්න.

(*v*) තුන් වන සමචතුරස්‍ර සංඛ්‍යාවෙන් තුන්වන ත්‍රිකෝණ සංඛ්‍යාව අඩු කළ විට පිළිතුර ලෙස ලැබෙන්නේ ත්‍රිකෝණ සංඛ්‍යාවකි. එය කී වන ත්‍රිකෝණ සංඛ්‍යාව ද යන්න සොයන්න.

05) නිවෙසක ජනවාරි 1 වන දින වැය වී තිබූ විදුලි ඒකක ගණන 5.83 කි. ජනවාරි 1 සහ 2 යන දින දෙකේම වැය වී තිබූ මුළු විදුලි ඒකක ගණන 8.49කි.

$(i)$ එසේ නම් ජනවාරි 2 දින වැය වූ විදුලි ඒකක ගණන සොයන්න.

$(ii)$ 5.83 යන සංඛ්‍යාව සංඛ්‍යාංකකරාමුවක නිරූපණය කරන්න.

$(iii)$ ඉහත සංඛ්‍යාවේ 3 ඉලක්කම පිහිටන ස්ථානයේ නම සහ එම ඉලක්කමෙන් නිරූපිත අගය ලියන්න.

$(iv)$ 0.8 යන්න භාගයක් ලෙස ප්‍රකාශ කරන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

06) $(i)$ පහත දී ඇති වාක්‍ය වල හිස් තැන් සඳහා වඩාත් සුදුසු වචන "පළල, දිග, ගැඹුර, ඝණකම" යන වචන අතරින් තෝරා හිස් තැන් සම්පූර්ණ කරන ලද වාක්‍යය නැවත ලියන්න.

$a)$ පරාලයක ........................ $3m$ වේ.

$b)$ ලෑල්ලක ........................ $1cm$ වේ.

$c)$ කාණුවක ........................ $20cm$ වේ.

$(ii)$ නගර දෙකක් අතර දුර $5012m$ වේ. එය කිලෝමීටර සහ මීටර වලින් ලියන්න.

$(iii)$ ත්‍රිකෝණාකාර ආස්තරයක දාර තුනෙහි දිග පිළිවෙලින් $13cm\ 5mm$, $11cm\ 2mm$ සහ $15cm$ වේ. එහි පරිමිතිය සොයන්න.

$(iv)$ නිමල්ගේ උස $1m\ 13cm$ ද, කමල්ගේ උස $110cm$ ද, අනිල්ගේ උස $1.18m$ ද වේ. ක්‍රමයෙන් උස වැඩිවන පිළිවෙලට තිදෙනාගේ නම් ලියන්න.

07) වාහනයක ඉන්ධන ටැංකියේ ඉන්ධන $13l\ 95ml$ ප්‍රමාණයක් තිබුණි.

$(i)$ ඉහත ඉන්ධන ප්‍රමාණය මිලිලීටර් වලින් දක්වන්න.

$(ii)$ ඉහත ඉන්ධන ටැංකියට තවත් ඉන්ධන $5l\ 918ml$ ප්‍රමාණයක් එකතුකලේ නම්, දැන් ඉන්ධන ටැංකියේ ඇති මුළු ඉන්ධන ප්‍රමාණය කොපමණ ද?

$(iii)$ කුරුම්බා ගෙඩියක $725ml$ ප්‍රමාණයක් කුරුම්බා වතුර අඩංගුව තිබුණි. එවැනි කුරුම්බා ගෙඩි 3ක වතුර පස්දෙනෙකුට සමව බෙදා දුන්නේ නම්, එක් අයෙකුට ලැබෙන ප්‍රමාණය නිමාණය කරන්න.

$(iv)$ ඔබට වතුර පිරවූ බේසමක් සහ $650ml$,$500ml$,$400ml$ බැගින් වූ කුඩා භාජන තුනක් පමණක් ලැබී ඇත. ඉහත කුඩා භාජන තුනෙන් එකකට ජලය $350ml$ පුරවාගන්නේ කෙසේ ද?